# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 1 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 ජනවාරි මස 28 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 ජනවාරි මස 28 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **2.00 යි.** තැපැල් ගාස්තුව **:** රු. **5.00 යි.**

# 2011 අංක 1 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 ජනවාරි මස 28 වැනි දින]

එල්.ඩී.—ඕ. 11/2010.

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක 1 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතට 5අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 5අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"රුපියල් මිලියන පහකට වැඩි ණය සම්බන්ධයෙන් 3, 4 සහ 5 වගන්ති අදාළ වීම.

5අ. (1) යම් ණය මුදලක් රුපියල් මිලියන පහකට අඩුවන අවස්ථාවක එම ණය මුදල ගෙවීම පැහැරහැරීම සම්බන්ධයෙන් එම ණය මුදල ආපසු අයකර ගැනීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රකාරව කිසිදු කටයුත්තක් ආරම්භ කිරීම හෝ ඉහත කී පනතේ 4 වන වගන්තිය හෝ 5 වන වගන්තිය ප්‍රකාරව කිසිදු පියවරක් ගැනීම හෝ නොකළ යුතු ය :

එසේ වුව ද, ගෙවීම් පැහැර හැර ඇති අවස්ථාවේ දී එසේ ගෙවීම පැහැර හැර ඇති තැනැත්තාට ප්‍රදානය කරන ලද ණය මුදල මත බැංකුවට ගෙවිය යුතු සහ අයවිය යුතු මුදල ගණනය කිරීමේ දී එම ණය මුදල මත උපචිත වී ඇති පොලිය සහ ඒ මත පනවා ඇති යම් දණ්ඩන මුදලක්, සැලකිල්ලට නොගත යුතු ය.

PL 005278 - 3,490 (2010/10)

(2) යම් බැංකුවක් මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමට අදාළ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ සාදන ලද සංස්ථාගත කිරීමේ නියමයක් මගින් පිහිටුවන ලද යම් බැංකුවක් සම්බන්ධයෙන් ද මේ පනතේ 5අ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අර්ථ නිරූපනය.

22. "බැංකුව" යන්නෙන් යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් ගෙවීම පැහැර හැරීමක් කර ඇති විටෙක, ඒ ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ වෙනත් අනුග්‍රහ මුදල සඳහා ඇප වශයෙන් බැංකුව වෙත උකස් කර ඇති යම් චංචල හෝ නිශ්චල දේපළ තම සන්තකයට ගැනීමට බලය ඇති 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව සඳහන් වී ඇති යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.